සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
**Third Term Test**

| ශ්‍රේණිය / தரம் / Grade | 12 | විෂයය / பாடம் / Subject | යුරෝපා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
* **I කොටසෙහි 1-40** දක්වා ප්‍රශ්න සියල්ලට ම **මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
* **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක **01** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරින් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

(1) (1) ජුපිටර් (2) ඇතීනා (3) පොසීඩන්
(4) සියුස් (5) ඇෆ්‍රෝඩයිට් (..........)

(2) (1) ප්‍රජා පීඩන පාලනය (2) කතිපයාධිපති ආණ්ඩුව (3) ප්‍රජාතන්ත්‍රවාදය
(4) රාජාණ්ඩුව (5) පූජක තන්ත්‍රය (..........)

(3) (1) ගෝල් (2) කොරින්ත් (3) ඇතැන්ස්
(4) ස්පාටා (5) මිලේටස් (..........)

(4) (1) ආර්ක්ටික් (2) මර්මරා (3) බෝල්ටික්
(4) ඊජියන් (5) ආඩ්‍රියාතික් (..........)

(5) (1) ටොලමි (2) ජුවනෙල් (3) වර්ජිල්
(4) හොරස් (5) ඩවිඩ් (..........)

(6) (1) ඇකඩමි (2) ලයිසියම් (3) කොලෝසියම්
(4) කේම්බ්‍රිජ් (5) ඔක්ස්ෆර්ඩ් (..........)

Past Papers Wiki

(7) (1) රෆායල් (2) මැසෙක්සියෝ (3) ජීන්බෝඩැන්
(4) මයිකල් ආංජලෝ (5) ලියනාඩෝ ඩාවින්චි (..........)

(8) (1) මිලාන් (2) මෙඩිචි (3) වෙනීසිය
(4) ෆ්ලෝරන්ස් (5) නේපල්ස් (..........)

(9) (1) මාටින් ලූතර් (2) ජෝන් කැල්වින් (3) ජීන්ජැක් රූසෝ
(4) ජෝන් වයික්ලිෆ් (5) ජෝන් හස් (..........)

(10) (1) රජතුමා (2) ප්‍රවේණි දාසයා (3) වංශාධිපතිවරයා
(4) අගමැතිවරයා (5) පූජකවරයා (..........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියෙන් ඇති **වරහන** තුළ ලියන්න.

(11) (1) බෝල්ටික් - මුහුද
(2) ඩාඩනල්ස් - කඳුවැටිය
(3) සූවස් - ඇළ
(4) බහමාස් - දූපත්
(5) ඩැනියුබ් - ගඟ
(..........)

(12) (1) කබ්රාල් - බ්‍රසීලය
(2) කෝටෙස් - මෙක්සිකෝව
(3) වස්කෝද ගාමා - ඉන්දියාව
(4) බර්තෝලමියුදියස් - වෙනිසියුලාව
(5) මකියාවේලි - ක්විබෙක්
(..........)

(13) (1) රූසෝ - සමාජ සම්මුතිය
(2) මැකියාවෙලි - කුමාරයා
(3) ඇඩම් ස්මිත් - ජාතීන්ගේ ධනය
(4) තෝමස් හොබ්ස් - ලෙවියතාන්
(5) මොන්ටෙස්කියු - මගේ සටන
(..........)

(14) (1) ජේම්ස් වොට් - වාෂ්ප එන්ජිම
(2) රිචඩ් ආර්ක්රයිට් - ජල රාමුව
(3) ජෝර්ජ් සටීවන්සන් - ආරක්‍ෂක පහන
(4) ජෝන් කේ - සැලෙන (දුවන) නඩාව
(5) ජේම්ස් හාග්‍රීව්ස් - ජෙනී යන්ත්‍රය
(..........)

(15) (1) කුරුස යුද්ධය - ක්‍රිස්තියානි භක්තිකයින් හා මුස්ලිම්වරුන් අතර
(2) පෙලපොනීසියානු යුද්ධය - ඇතැන්ස් සහ ස්පාටා අතර
(3) පියුනික් සටන - රෝමය සහ කාර්තේජය අතර
(4) ඇමෙරිකන් නිදහස් සටන - අමෙරිකාව සහ ස්පාඤ්ඤය අතර
(5) සියක් අවුරුදු සටන - අමෙරිකාව සහ ස්පාඤ්ඤය අතර
(..........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට **ගැළපේ**. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට **නොවේ.** Y තීරුව X තීරුව සමඟ ගැළපෙන **අනුපිළිවෙලට** සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන** තුළ ලියන්න.

(16) **X** / **Y**

| | X | | Y |
|---|---|---|---|
| (i) | වැඩවසම් ක්‍රමය | A | නව රාජාණ්ඩුක්‍රමය |
| (ii) | ජාතික රාජ්‍ය | B | අධිරාජ්‍ය ගොඩනැගීම |
| (iii) | දේශ ගවේෂණ | C | ජේසුයිට් නිකාය |
| (iv) | කාර්මික විප්ලවය | D | නාගරීකරණය |
| (v) | ප්‍රතිරෙපරමාදුව | E | ස්වයං පෝෂිත ආර්ථිකය |

(1) E A B C D (2) E A C D B (3) E A D B C
(4) E A B D C (5) E A C B D

(..........)

(17) **X** / **Y**

| | X | | Y |
|---|---|---|---|
| (i) | වොල්ගා ගඟ | A | ඉංග්‍රිසි ඔඩය |
| (ii) | තේම්ස් ගඟ | B | බෝල්ටික් මුහුද |
| (iii) | විස්ටියුලා ගඟ | C | උතුරු මුහුද |
| (iv) | රයින් ගඟ | D | ආද්‍රියාතික් මුහුද |
| (v) | පෝ ගඟ | E | කැස්පියන් මුහුද |

(1) E A B C D (2) E A C D B (3) E A D B C
(4) E A B D C (5) E A C B D

(..........)

(18) **X** / **Y**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඩොනටෙලෝ | A | වීනස්ගේ උපත |
| (ii) | මයිකල් ආංජලෝ | B | මොනාලිසා |
| (iii) | ටිටියන් | C | මෝසස් |
| (iv) | ලියානාඩෝ ඩාවින්චි | D | v වන චාල්ස් |
| (v) | බොටිචෙල්ලි | E | ඩේවිඩ් |

(1) E A B C D (2) E A B D C (3) E B D C A
(4) E B C D A (5) E C D B A

(..........)

(19) **X** / **Y**

| | X | | Y |
|---|---|---|---|
| (i) | VIII වන හෙන්රි | A | ද මෙඩිචි |
| (ii) | XVI වන ලුවී | B | මේරි ටියුඩර් |
| (iii) | ෆර්ඩිනැන්ඩ් | C | ඈන් බෝලීස් |
| (iv) | IV වන හෙන්රි | D | මාරි ඇන්ටොයිනට් |
| (v) | II වන පිලිප් | E | ඉසබෙලා |

(1) C A B D E (2) C B D E A (3) C D E A B
(4) C E A B D (5) C A D E B (..........)

(20) X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජුපිටර් | A | ප්‍රඥාවට අධිපති දෙවගන |
| (ii) | මාර්ස් | B | ආලයට අධිපති දෙවගන |
| (iii) | වීනස් | C | යුද්ධයට අධිපති දෙවියා |
| (iv) | මිනෙර්වා | D | මුහුදට අධිපති දෙවියා |
| (v) | නෙප්චූන් | E | ආකාශයට අධිපති දෙවියා |

(1) E C B A D (2) D A E C B (3) B A E D C
(4) E A D C B (5) A E B D C (..........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට **නොගැළපේ**. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

(21) දේශ ගවේෂණ,

(1) පෘතුගාලය සහ සපාඤ්ඤය යන රටවල් පුරෝගාමී විය
(2) ප්‍රධාන අරමුණ වූයේ වෙළදාමයි
(3) සියළු ගවේෂණ කොන්ස්තන්තිනෝපලය කේන්ද්‍රකරගෙන සිදුවිය
(4) ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ පීරු දේශය ජයග්‍රහණය කලේය
(5) අප්‍රිකානු මහද්වීපයේ දකුණු කෙලවරට ලගාවූ පළමු පෘතුග්‍රීසි ජාතිකයා බර්තෝලමියුදියස්ය.

(..........)

(22) තිස් අවුරුදු යුද්ධය,

(1) යුද්ධය අවසානයේදී ප්‍රංශය පරාජයට පත්විය.
(2) යුද්ධය ඇති වූ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ජර්මනියයි.
(3) කතෝලික හා ප්‍රොතෙස්තන්ත්‍ර රාජ්‍ය අතර යුද්ධයක් ලෙස ආරම්භ විය
(4) මෙම යුද්ධය යුරෝපයේ ඇතිවූ අවසන් ආගමික යුද්ධයයි.
(5) ඔග්ස්බර්ග් සාම ගිවිසුමේ අඩුපාඩු යුද්ධය ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන හේතුවකි. (..........)

(23) ප්‍රංශ විප්ලවය,

(1) පැරණි රාජාණ්ඩුක්‍රමයේ දූර්වලතා ප්‍රංශ විප්ලවයට තුඩුදුන් හේතුවක් විය.
(2) වෝල්ටෙයාර් ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනිකයෙකු විය.
(3) 1789 මැයිමස ස්ටේට්ස් ජනරල් සභාව රැස්විය.
(4) 1789 ජුලි මාසයේදී බැස්ටීලයට පහර දීම සිදුවිය.
(5) 1793 ජනවාරි මාසයේ XVI වන ලුවී රජුට ඔටුනු පැළඳ වීය. (..........)

(24) එංගලන්තයේ පාර්ලිමේන්තු වර්ධනය,

(1) 1928 සවර්ජන ඡන්ද බලය පිළිබඳ පනත සම්මත වීම
(2) 1832 දී මහා ප්‍රතිසංස්කරණ පනත සම්මත කිරීම
(3) 1766 දී ඇමෙරිකාවේ යටත්විජිත නිදහස් ප්‍රකාශය නිකුත් කිරීම
(4) 1768 උත්කෘෂ්ඨ විප්ලවය
(5) 1714 දී ප්‍රථම අගමැති රොබට් වෝල්පෝල් යටතේ කැබිනට් ක්‍රමය ආරම්භ වීම (..........)

(25) ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය,

(1) ජේසුයිට් නිකාය
(2) නිශ්ශබ්ද විලියම් ඝාතනය කිරීම
(3) ට්‍රෙන්ට් සම්මේලනය
(4) මිෂනාරි ව්‍යාපාරය ආරම්භ වීම
(5) ධර්මාධිකරණය (..........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A B C D යන ප්‍රතිචාර හතර අතුරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. ඒ අනුව නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා

A සහ B පමණක් නිවැරදි නම් ............................................................ 1 ද,
A සහ C පමණක් නිවැරදි නම් ............................................................ 2 ද,
B සහ C පමණක් නිවැරදි නම් ............................................................ 3 ද,
C සහ D පමණක් නිවැරදි නම් ............................................................ 4 ද,

**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් 5 ද, **වරහන තුළ** ලියන්න.

**උපදෙස් සම්පිණ්ඩනය**

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A සහ B පමණක් නිවැරදිය | A සහ C පමණක් නිවැරදිය | B සහ C පමණක් නිවැරදිය | C සහ D පමණක් නිවැරදිය | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි ය |

(26) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ මොනවාද?

A - වරප්‍රසාද ලත් ප්‍රභූ පන්තිය
B - සථිර යුධ හමුදාවක් පවත්වා ගැනීම
C - අසාහාය රාජාණ්ඩුව
D - බලය සංකේන්ද්‍ර ගත වීම

(..........)

(27) යුරෝපයේ රෙපරමාදු ව්‍යාපාරයට තුඩුදුන් සාධක මොනවාද?

A - ජර්මනියේ පැවති ආගමික මතභේද
B - ජර්මනිය ඔස්ට්‍රියාවට එරෙහිව යුධ ප්‍රකාශ කිරීම
C - VIII වන හෙන්රි රජු පල්ලියෙන් නෙරපා දැමීම
D - 1555 දී ඔග්සබර්ග් සම්මේලනයේදී එළඹි ඉඩම් පිළිබඳ සමථය ක්‍රියාත්මක නොකිරීම

(..........)

(28) පහත දැක්වෙන ඒවා අතුරෙන් යුරෝපය මධ්‍යතන යුගයේ සිට නූතන යුගයට පරිවර්තනය වීම සලකුණු කරන වර්ධනයන් කවරේද?

A - බලය විකේන්ද්‍රණය වූ රාජාණ්ඩුව
B - එක්සත් යුරෝපීය ක්‍රිස්තු සභාව
C - වාණිජ ධනවාදයේ නැගීම
D - දේශ ගවේෂණය

(..........)

(29) පහත දැක්වෙන ඒවා අතුරෙන් පුනරුදයේ ලක්ෂණ මොනවාද?

A - මානව වාදය ඉස්මතුවීම
B - ධනවත් වෙළඳුන් කලාකරුවන්ට අනුග්‍රහය දැක්වීම
C - ක්‍රිස්තියානි ආගමික සභාවේ දූෂණ
D - රෝම අධිරාජ්‍ය බිඳ වැටීම

(..........)

(30) පහත දැක්වෙන්නන් අතුරෙන් රෝම කවියෝ කවුරුන්ද?

A - වර්ජිල්
B - සැෆෝ
C - හොරස්
D - පින්ඩාර්

(..........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

(31) ඇලෙක්සැන්ඩර්ගේ ගුරුවරයා ලෙස සේවය කලේ කිනම් ග්‍රීක දාර්ශණිකයාද?

(1) ප්ලේටෝ (2) සිනෝ (3) ඇරිස්ටෝටල්
(4) ඩිමොක්‍රිටස් (5) සොක්‍රටීස් (..........)

(32) එංගලන්තයේ පළමු අගමැතිවරයා ලෙස සැලකෙන්නේ කවරෙක්ද?

(1) රොබට් වෝල් පෝල් (2) ජොර්ජ් කැනිං
(3) විලියම් පිට් (4) ඔලිවර් ක්‍රොම්වෙල්
(5) විලියම් ග්‍රැන්විල් (..........)

(33) පළමුවන රෝම අධිරාජ්‍යයා වනුයේ කවුරුන්ද?

(1) ක්ලෝඩියස් (2) මාකස් අවුරේලියස් (3) ඔගස්ටස්
(4) ජුලියස් සීසර් (5) මහා ඇලෙක්සැන්ඩර් (..........)

(34) නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වනුයේ,

(1) ඩැමස්කස් (2) ෆ්ලෝරන්ස් (3) සාඩිනියාව
(4) කොන්ස්තන්තිනෝපලය (5) රෝමය (..........)

(35) ඇමෙරිකා මහද්වීපයේ ජනපද පිහිට වූ යුරෝපා ජාතීන් නොවන්නේ,

(1) ස්පාඤ්ඤය (2) ඉංග්‍රීසි (3) ස්විට්සර්ලන්තය
(4) පෘතුගීසි (5) ප්‍රංශ (..........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට **හොඳින්ම ගැලපෙනුයේ** පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලදැයි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදි ය | වැරදි ය |
| 2. | නිවැරදි ය | නිවැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදිවන අතර **පළමු වැන්න** මැනවින් පහදා දෙයි. |

| **ප්‍රශ්න අංකය** | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 36 | ග්‍රීක නාට්‍ය රග දක්වන ලද ප්‍රධාන රැගුම් හලවුයේ පාර්තිනොන්ය. | පළමුවන රෝම අධිරාජයා ජුලියස් සීසර්ය. (..........) |

| | | |
|---|---|---|
| 37 | ක්‍රි.ව 1498දී වස්කෝද ගාමා බහමාස් දූපත් වලට ගොඩබැස්සේය. | 1688 දී උත්කෘෂ්ඨ විප්ලවයෙන් පාර්ලිමේන්තුවට ජය අත්විය. (..........) |
| 38 | විශාල නගර බිහිවීම කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයකි. | 1498 දී ඔටෝමන් තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය යටත් කර ගත්තේය. (..........) |
| 39 | ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන තේමා පාඨය වනුයේ "නිදහස සමානාත්මතාවය සහෝදරත්වය" යන්නයි. | පුනරුදය ආරම්භ වූයේ ඉතාලියේ වැනීසිය නම් නගරය කේන්ද්‍ර කරගෙනය. (..........) |
| 40 | යුරෝපයේ කාර්මික හා ආර්ථික ප්‍රගතිය සැම තැනම එක හා සමාන වේගයෙන් සිදු නොවීය. | නිෂ්පාදනය බෙදාහැරීම සහ ව්‍යාපාර වාණිජ කටයුතු හා ශ්‍රම සංවිධානය යන අංශවල දහඅටවන සියවස මැද සිට එංගලන්තයේ ඇතිවූ වෙනස්වීම, ප්‍රංශ විප්ලවය ඇතිවන තුරුම ප්‍රංශයේ ආරම්භ නොවීය. (..........) |

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 12 | විෂයය / பாடம் / Subject | යුරෝපා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* මෙම ප්‍රශ්න පත්‍රය A, B, C ලෙස කොටස් **තුනකින්** සමන්විත ය.
* A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C **කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති යුරෝපයේ දළ සිතියමේ පහත ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | |
|---|---|
| 1. රෝමය | 7. කොන්ස්තන්තිනෝපලය |
| 2. පෘතුගාලය | 8. මධ්‍යධරණී මුහුද |
| 3. ග්‍රීසිය | 9. උතුරු මුහුද |
| 4. කෝසිකා | 10. පෝ ගඟ |
| 5. ඉංග්‍රිසි ඕඩය | 11. කළු මුහුද |
| 6. පැරීසිය | 12. ලන්ඩන් |

(ලකුණු1x12=12)

## B කොටස

2. පුරාණ ග්‍රීකයන්ගේ සංස්කෘතියේ පහත දැක්වෙන අංශවලින් ඕනෑම දෙකක ඔවුන්ගේ කාර්ය සංසිද්ධිය සැකෙවින් විස්තර කරන්න.

| | |
|---|---|
| 1. ආගම | 3. සාහිත්‍යය |
| 2. දර්ශනය | 4. කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය |

(ලකුණු 08 x 2 = 16)

3. "ජාතික රාජ්‍යය යනු නූතන යුගයේ ආරම්භයේ යුරෝපයේ පහල වූ සුවිශේෂී දේශපාලන සංවිධානයකි"
   (i) ජාතික රාජ්‍යයන් ආරම්භ වූ යුරෝපා රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) ඉහත ඔබ නම් කරන ලද එක් රටක ජාතික රාජ්‍ය ගොඩනැගීමෙහිලා වැදගත් මෙහෙයක් ඉටුකල පාලකයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)
   (iii) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 05)
   (iv) ප්‍රථමයෙන් ජාතික රාජ්‍යයන් බිහිවූ රටවල ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 07)

PAST PAPERS WIKI



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4. “පුනරුදය යනු මධ්‍යතන යුරෝපය නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධාන සාධකයයි.”

(i) පුනරුදය ආරම්භ වූ රට හා නගරය නම් කරන්න. (ලකුණු 02)

(ii) පුනරුදය යන්නෙන් අර්ථ දැක්වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) පුනරුදය ඇතිවීමට බලපෑ ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 04)

(iv) පුනරුදයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 07)

5. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් පිළිබඳ ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

(i) ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භය හා ඉන් ලොවට ලද දායද.

(ii) රෝම ශිෂ්ඨාචාරයේ ආගම හා අධ්‍යාපනය.

(iii) බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම.

(iv) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට බලපෑ ආගමික හේතු (ලකුණු 08 x 2 = 16)

## C කොටස

6. (i) කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීමට බලපෑ හේතු හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කාර්මික විප්ලවය ආරම්භ වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) කාර්මික විප්ලවය වෙනත් ක්ෂේත්‍රවල ව්‍යාප්ත වූ ආකාරය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 06)

7. ප්‍රංශ විප්ලවය ආරම්භ වීමට බලපාන දේශපාලන, ආර්ථික, සමාජ සංස්කෘතික හේතුන් පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 16)

8. (i) ඇමෙරිකානු නිදහස් සටන ඇති වීමට බලපෑ ප්‍රධාන හේතු විග්‍රහ කරන්න. (ලකුණු 10)

(ii) ඇමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 06)

9. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ පරීක්ෂා කරන්න.

(i) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා
(ii) පෘතුගාලයේ දේශගවේෂණ ව්‍යාපාරය
(iii) දේශගවේෂණ ව්‍යාපාරය ආරම්භ වීමට බලපෑ හේතු
(iv) ඉස්ලාම් ශිෂ්ඨාචාරයෙන් යුරෝපය ලද දායාද

(ලකුණු 8 x 2 = 16)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank